සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**වර්ෂ අවසාන ඇගයීම - 2012**

**11 - ශ්‍රේණිය**

02494

# ඉස්ලාම් ධර්මය - I

නම / විභාග අංකය : ..................................................................... කාලය පැය 01 යි

සැලකිය යුතුයි.

(i) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (x) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. අල්ලාහ්ගේ පරිශුද්ධ නාමයන්ගෙන් අල් කුද්දූස් යන්නෙහි තේරුම
i. සර්වලෝක අධිපති ii. අභයදානය දෙන්නා
iii. අති පාරිශුද්ධවන්තයා iv. සෙනෙහවන්තයා

02. ජයග්‍රහණය සඳහා වහා පැමිණෙන්න යන තේරුම දෙන අදාන් මගින් පැවසෙන වාක්‍ය වන්නේ
i. හයියහලස් සලාත් ii. හයියහලල් ෆලාත්
iii. කද්කාමතිස් සලාත් iv. අස්සලාතු කයිරුම් මිනන් නවම්

03. අහ්ලුල් කිතාබ් යන්නෙන් හැඟවෙන්නේ
i. නබි හිතමිතුරන් ii. නබි තුමාගේ පවුලේ උදවිය
iii. නබි තුමාගේ භාර්යාවන් iv. ආගම් ලද්දවුන්

04. මුස්ලිම්වරයෙකු තම පරිසරය ආරක්ෂා කරමින් එහි සුන්දරත්වයට හානියක් නොවන සේ කටයුතු කිරීම
i. ෆර්ළු ඓන් ii. ෆර්ළු කිෆායා
iii. මුබාහ් iv. සුන්නත් ක්‍රියාවකි

05. නීති මූලාශ්‍රයන්ගෙන් වහී කෙරූ මත්ලූව් මගින් ලැබුණු මූලාශ්‍රය වන්නේ
i. අල් හදීස් ii. අල් කුර්ආන්
iii. කියාස් iv. ඉජ්තිහාද්

06. සුන්නත් වල් ජමාඅතයට අයත් මුලින්ම ලොව බිහිවූ මද්හබය වන්නේ
i. ෂාෆි මද්හබය ii. හනෆි මද්හබය
iii. හම්බලි මද්හබය iv. මාලික් මද්හබය

07. මුස්ලිම්වරුනට සලාතය අනිවාර්ය වූ මාසය
i. මුහර්රම් ii. රජබ්
iii. රමළාන් iv. ෂඃබාන්

08. කිසියම් ජයග්‍රහනයක් වෙනුවෙන් ඉටුකරන තුති පිදීමේ සුජූද් හඳුන්වන්නේ
i. සජ්දා ෂුකර් ii. සජ්දා සහ්වු
iii. සජ්දා හාජා iv. සජ්දා තිලාවත්

09. ෂව්වාල් පළමු හඳ දුටු පුද්ගලයෙකු උපවාසයේ නිරතවීම
i. සුන්නත් ii. ෆර්ළු iii. මක්රූහ් iv. හරාම්

10. මුල් වරට ඇබිසීනියාවට හිජ්රත් කළ කණ්ඩායමට නායකත්වය දුරුවේ
   i. ජඃෆර් ඉබනු අබූතාලිබ් ii. මුආද් ඉබනු ජබල්
   iii. මුස්අබ් ඉබනු උමෛර් iv. කාලිද් ඉබනු වලීද්

11. සෙවණක් නැති කියාමා දිනයේ අර්ෂයේ සෙවණින් පෙනී සිටින්නන්
   i. සලාතය නියමිත වේලාවට ඉටු කළවුන් ii. අල්කුර්ආනය වන පොත් කළවුන්
   iii. දෙමාපියන්ට ගෞරවයෙන් සැලකූ දරුවන් iv. තම තාරුණ්‍යය ඉබාදතයේ ගතකළවු

12. පහත සඳහන් ජරාඉමුල්හුදූද් ගණයේ අපරාධය වන්නේ
   i. මත් ද්‍රව්‍ය භාවිතය සහ පැහැරගැනීම
   ii. සැලසුම් කළ මිනීමැරුම සහ අත්වැරදීමෙන් සිදුවන මිනීමැරුම
   iii. සැලසුම් කළ සොරකම සහ අත්වැරැද්දෙන් තුවාල කිරීම
   iv. දුරාචාරය සහ සොරකම

13. අල්කුර්ආනය පහළවීම සහ එය ලබාගැනීමට සම්බන්ධයෙන් ඉහත වචන අනුපිළිවෙල වන්නෙ
   A ලෛලතුල් බද්ර් B බෛතුල් ඉස්සා
   C කුත්තාබුල් වහී D ලව්හුල් මහ්ෆූල්
   i. BCAD ii. ADBC iii. BADC iv. DBAC

14. ඉස්තිහ්සාන් යනු ඉස්ලාමයේ
   i. උප මූලාශ්‍රයකි ii. කියාස් වර්ගයකි
   iii. යහගුණාංග පිළිබඳ එකකි iv. සුන්නාවට අදාළ එකකි

15. මද්හබ් ඉමාම්වරුගෙන් ඔවුහු මියගිය අනුපිළිවෙල වන්නේ ඉමාම්
   i. ෂාෆි, අබූ හනීෆා, හන්බල්, මාලික් (රහ්)
   ii. අබූහනීෆා, ෂාෆි, හන්බල්, මාලික් (රහ්)
   iii. අබූහනීෆා, මාලික්, ෂාෆි, හන්බල් (රහ්)
   iv. හන්බල්, මාලික්, ෂාෆි, අබූහනීෆා (රහ්) වේ.

16. කෙටි කර ඉටුකල නොහැකි සලාත් වන්නේ
   i. සුබ්හ් ii. මඃරිබ් iii. ඉෂා මඃරිබ් iv. සුබ්හ්, මඃරිබ්

17. A කොටසෙහි ඇති වචනයට B කොටසින් සුදුසු වචනය සම්බන්ධ කිරීමේදී ලැබෙන අනුපිළිවෙ
   වන්නේ
   i. ඉබාදා A තහජ්ජත් සලාතය
   ii. මුආමලාත් B විවාහය
   iii. මුනාකආත් C දාන මාන
   iv. ඇලාක් D වෙළෙඳාම
   i. ABDC ii. ADBC iii. BADC iv. CABD

18. සෆා මර්වා, කඃබා හල්කු යන ඒවා සමග පමණක් සම්බන්ධ ඉබාදතය
   i. උම්රා ii. හජ් iii. තවාෆ් iv. සඊ

19. ඉමාම් මාලික් (රහ්) තුමාගේ ශිෂ්‍යයෙක්ද ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ ගුරුවරයාද වූ
   ඉමාම්
   i. ඉමාම් අබූහනීෆා ii. ඉමාම් බුහාරි
   iii. ඉමාම් ෂාෆිඊ iv. ඉමාම් මුස්ලිම්

20. කාන්තාවක් සිය ස්වාමිපුරුෂයාගේ විවාහ බන්දනයෙන් ස්වාමි පුරුෂයාගේ වැරද්දක් මත සාධාරණ දික්කසාදයකට යෑම

i. කුල්උ ii. ෆස්කු iii. තලාක් රජ්ඊ iv. බායින්

21. වෛද්‍ය විද්‍යාවේ පියා වශයෙන් සැලකෙන විද්වතා

i. ඉමාම් ගස්සාලි ii. ඉබ්නු සිනා
iii. අල් ඉබ්නු සාහිල් iv. සාහිල් අල් රාසි

22. සුන්නත් උපවාසයක් වූ අයියාමුස් සූද් දින වන්නේ

i. මාස් පතා 13,14,15 චන්ද්‍ර දින ii. මාස් පතා 27,28,29 චන්ද්‍ර දින
iii. ෂව්වාල් චන්ද්‍ර දින 2-7 දින දක්වා iv. දුල්හජ් 11,12,13 චන්ද්‍ර දින

23. ඉපයීමට පිටත් නොවී මස්ජිදයේම රැඳී සිටියවුන්ට මට ආහාර ලබාදෙන්නැයි ප්‍රාර්ථනා කිරීම පමණක් නොසෑහේ. යනුවෙන් අවවාද කළ කලීෆා

i. උමර් (රලි) ii. අලි (රලි)
iii. ඉමාම් මාලික් (රහ්) iv. උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්)

24. අධික ලෙස දන් දීම නිසා දිගු අතැත්තිය යනුවෙන් විරුදාවලිය ලත් කාන්තාව

i. සෛනබ් බින්තු ජහ්ෂ් (රලි) ii. ජුවයිරියා (රලි)
iii. උම්මු සල්මා (රලි) iv. හෆ්සා (රලි)

25. ප. ව. 4.00 ට මාතලෙන් පිටත්ව කොළඹ ආ මගියෙකු මෑරිබ් සලාතය එකතු කර ඉටුකල හැකි හොඳම මාර්ගය

i. අසර් සලාතය සමග මෑරිබ් සලාතය කිරීම
ii. කොළඹ ආ විගස ඉෂා සලාතය කිරීම
iii. කොළඹ පැමිණ ඉෂා සලාතය ඉටුකොට මෑරිබ් කිරීම
iv. කොළඹ පැමිණ පසු මෑරිබ් සලාත ඉටුකොට ඉෂා කිරීම

26. ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසයේ "මඩිගේ" යන වචනය සම්බන්ධ වන්නේ

i. වෛද්‍ය විද්‍යාව සමඟ ii. දේශපාලනය සමඟ
iii. ආරක්ෂාව සම්බන්ධයෙන් iv. අධ්‍යාපනය සම්බන්ධව

27. භූමියේ පස සාරවත් කරමින් පැළ සිටුවීමේ ක්‍රියාදාමය හඳුන්වන්නේ

i. ඉබාදත් ii. ඉමාරත් iii. කිලාෆත් iv. සිරාත්

28. තමන්ට සිදුවන දුක සතුට හදවතින්ම පිළිගෙන දුක්බර සිදුවීම් අල්ලාහ් වෙනුවෙන්ම ඉවසා අල්ලාහ් වෙනුවෙන් ජීවත්වීම

i. තවක්කුල් ii. ෆර්ළ iii. රිලා iv. තව්හීද්

29. මිනිසෙකු මිය ගිය පසු සිදුවන සිද්ධිය පහත සඳහන් වේ. ඒවා අනුපිළිවෙළට සකස් කළවිට

A නිසාබ් B බෑස් C හෂ්ර් D සිරාත් E ෂෆාඅත්

i. EABCD ii. CBAED iii. BCADE iv. ABCED

30. නබි (සල්) තමා ඇබිසීනියා, රෝමය, ඉරානය ප්‍රදේශ රාජ්‍ය පාලකයින්ට දෑවා පණිවිඩය යැවූ සහාබාවරුන් ගේ පිළිවෙළ වන්නේ

i. අමර් ඉබ්නු උමෛයා, තහියතුල් කල්බි, අබ්දුල්ලා ඉබ්නු හුසෛමා
ii. තහියතුල් කල්බි, අමර් ඉබ්නු, උමෛයා, අබ්දුල්ලා ඉබ්නු හුසෛමා
iii. තහියතුල් කල්බි, අබ්දුල්ලා ඉබ්නු හුසෛමා, අමර් ඉබ්නු උමෛයා
iv. අමර් ඉබ්නු උමෛයා, අබ්දුල්ලා ඉබ්නු හුසෛමා, තහියතුල් කල්බි

31. ගණිත විද්‍යාවේ පියා වශයෙන් සැලකෙන මුස්ලිම් විද්වතා
   i. අල් තබරි   ii. අල් හාජස්
   iii. අල් බරාබි   iv. අල් කවාරිස්මි

32. උමයියා වරුන්ගේ පාලනය අවසන් වූ වසර
   i. හිජ්රි 40   ii. හිජ්රි 132
   iii. හිජ්රි 562   iv. හිජ්රි 656

33. ඉමාම් ෂාෆි (රහ්) තුමන්ගේ ග්‍රන්ථ වලින් හදීස් ක්ෂේත්‍රයට දායකත්වය ලබා දුන් ග්‍රන්ථය
   i. කිතාබුල් උම්මු   ii. අර් රිසාලා
   iii. අල් මුස්නද්   iv. අහ්කාමුල් කුර්ආන්

34. අල් මුජ්තනා නමින් ආමන්ත්‍රණය වන අස්සිහාඋස්සිත්තා ග්‍රන්ථය වන්නේ
   i. සහී මුස්ලිම්   ii. ජාමිඋත් තිර්මිදි
   iii. සුනන් නසාඊ   iv. සුනන් ඉබ්නු මාජා

35. තම හදීස් ලිඛිත සටහන් වලින් හදීසයක් සොයමින් රාත්‍රී කාලය පුරාවටම රටඉඳි අනුභව කිරීමෙන් අසනීපව මිය ගිය ඉමාම්වරයා
   i. බුහාරි (රහ්)   ii. මුස්ලිම් (රහ්)
   iii. අබුදාවුද් (රහ්)   iv. තිර්මිදි (රහ්)

36. වරක් තම දෙමාපියන් ජීවත්ව සිටියදී ජිහාදය සඳහා සූදානම් වූ කෙනෙකු දිහා බලා නබිතුමන් මෙසේ පැවසූහ. දෙමාපියන්ට උපස්ථාන කිරීම
   i. ජිහාදයට වඩා උතුම් වේ   ii. අමල් අතුරින් අති උසස් වේ
   iii. හිජ්රනයට වඩා උසස් වේ   iv. හිජ්රත් ජිහාද් හි අමලය ලබා දේ

37. ඔබේ දිව සිංහයකු වැනිය ඔහු ඔබේ පාලනයේ සිටිනා තෙක් ඔබ සුරක්ෂිතය. සිංහයා මුදා හැරීමෙන් ඔබ මරා ඌ කන්නේය. යනුවෙන් පැවසුවේ
   i. අලි (රලි)   ii. අහ්මද් ඉබ්නු හම්බල්
   iii. අබ්දුල් කාදිර් ජීලානි   iv. අබ්දුල්ලා ඉබ්නු මසූද් තුමා වේ.

38. තක්බීර් තහ්රීමා යනු
   i. සලාතයේ ආරම්භ තක්බීර්
   ii. අවුරුදු උත්සව සලාතයට අදාල තක්බීර්
   iii. හාජ්වරු පවසන තක්බීර්
   iv. ඉහ්රාම් වස්ත්‍රය ඇද ගත් අයගේ තක්බීර්

39. යෙමන් රාජ්‍යයේ රජ පවුලට අයත් දෙදෙනකු ක්‍රි. ව. 640 දී ලංකාවට ආගමනය කළ අවස්ථාවේ කෙනෙකු බේරුවල ගොඩබැසගත් අතර අනෙකා ගොඩ බැස්සේ
   i. ත්‍රිකුණාමලයේ   ii. පුත්තලමේ   iii. මන්නාරමේ   iv. වැලිගමේ ය.

40. පහත සඳහන් කොටසේ 1-4 දක්වා වචන වලට සුදුසු සම්බන්ධීකරණය කොටසින් යා කළ විට 1-4 දක්වා වචනවල නිවැරදි යා කිරීම් අනුපිළිවෙල

| | | | |
|---|---|---|---|
| i. | වරහ් | A | පව් සිදු කිරීමට ඇති භය |
| ii. | කුස්උ | B | තීරණ ගැනීම අල්ලාහ්ට භාර කිරීම |
| iii. | තවක්කල් | C | ලෝකය පිළිබඳ ආශාවන් අතහැර ජීවත්වීම |
| iv. | ෂුහ්ද් | D | හරාම් හලාල් පිළිබඳ සැලකිල්ල |

   i. CABD   ii. ACBD
   iii. DABC   iv. BCDA

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2012**

**11 - ශ්‍රේණිය**

## ඉස්ලාම් ධර්මය - II

නම / විභාග අංකය : ........................................................................ කාලය පැය 02 යි

- **පළමු ප්‍රශ්නය සහ වෙනත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් අනෙකුත් එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් ලකුණු 40 ක්ද වශයෙන් ලකුණු 60 ක් හිමි වේ.**

1. කෙටි පිළිතුරු සපයන්න

   i. අල්ලාහ් නොවන කිසියම් දෙයක් මත දිව්රීම කුමන වර්ගයේ ෂිර්කයට අයත් වේද?

   ii. කියාමා දිනය හා ඒ ආශ්‍රිත සිද්ධීන්, අකීදාවේ කිනම් අංශයට අයත් වේද?

   iii. අල්කුර්ආන් සම්බන්ධයෙන් තර්තිබුන් නුසුල් කුමක් අදහස් කෙරේද?

   iv. ඉස්නාද්, මත්න් යන පදවල වෙනස කුමක්ද?

   v. අකීදා වට විරුද්ධ කණ්ඩායමක පුද්ගලයෙකු විසින් අලි (රලි) තුමන් ඝාතනය කරන ලදි. එම පුද්ගලයා සහ කණ්ඩායම ලියන්න.

   vi. ජාමිඋත් තිර්මිදි, මුවත්තා ග්‍රන්ථ දෙකේ වෙනස කුමක්ද?

   vii. තලාක් පවසන ලද කාන්තාව සහ ස්වාමි පුරුෂයා මියගිය කාන්තාව, සිටිය යුතු ඉද්දා කාල දෙකේ වෙනස කුමක්ද?

   viii. එළුවන් 120 දෙනෙකු සතු කෙනෙකු සකාත් දිය යුතු ප්‍රමාණය කොපමණද?

   ix. තවාෆුල් කුදුම්, තවාෆුල් විදා යන දෙක අතර වෙනස කුමක්ද?

   x. බුදල් හිමි පාර්ශවකරුවන් දෙකක් නම් කරන්න.

2. i. කුෆ්ර්, රිද්දත් අතරේ වෙනස කුමක්ද?

   ii. කුෆ්රය ඇතිකරන මාර්ග 2 ක් ලියන්න.

   iii. සුන්නත් වල් ජමාඅත් අයගේ අකීදාවේ සාරාංශය පිළිබඳව කරුණු 5 ක් පැහැදිලි කරන්න.

3. i. සලාතයේ වැදගත්කම කියවෙන අල්කුර්ආන් වාක්‍යයක් හෝ හදීසයක් ලියන්න.

   ii. ජමාත් සලාතයට අයත් සුන්නත් සලාත් 3 ක්ද කියාමුල් ලෛල් සලාතයට අයිති සලාතයන් 3 ක්ද නම් කරන්න.

   iii. සලාතය අතහැරීමෙන් සිදුවන විපාක නම් කොට පැහැදිලි කරන්න.

4. i. තලාක් අවස්ථා 2 ලියන්න.

   ii. ඉද්දා හි අරමුණු 3 ක් ලබා දෙන්න.

   iii. මහ්රම් යන අය වර්ග කොට උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

5. i. අපරාධය ඉස්ලාමයට අනුව නිර්වචනය කරන්න.
   ii. තහ්සීර් සහ එහි වැදගත්කම පැහැදිලි කරන්න.
   iii. අපරාධ සිදු නොවීමට ඉස්ලාම් පවසන ක්‍රම වේදයන් පැහැදිලි කරන්න.

6. i. නබි (සල්) තුමා කළ හිජ්රත් ගමනේ ප්‍රතිඵල දෙකක් දෙන්න.
   ii. මක්කා ජයග්‍රහණය කෙටියෙන් හඳුන්වන්න.
   iii. හුදෙයිබියා ගිවිසුම පිළිබඳ පැහැදිලි කරන්න.

7. i. ඉජ්මා හි කොටස් 2 නම් කරන්න.
   ii. තව්බාව පිළිගැනීම සඳහා පිළිපැදිය යුතු කරුණු 3 ක් ලියන්න.
   iii. අරාබි ජාතිකයන් ලංකාවට පැමිණීමෙන් මෙරටට සිදුවුණු සේවය පැහැදිලි කරන්න.